**#mediaethicsSL #SinhalaPress #lka #Divaina #January12**

තමන්ගේ රහස්‍ය මූලාශ්‍රයේ අවසරය නොමැතිව එය හෙළිදරව් නොකළ යුතුය යන්න සියලුම මාධ්‍යවේදීන් තරයේ පිළිපැදිය යුතු මාධ්‍ය ආචාර ධර්මයකි. ඒ සම්බන්ධයෙන් කිසිදු විවාදයක් නැත. කෙසේ නමුත් මෙහිදී ඇතැම් විට පදනමක් නොමැති සාවද්‍ය තොරතුරු ජනගත කිරීමටද ඇතැම් මාධ්‍යවේදියෙකුට මූලාශ්‍ර සඳහන් නොකිරීම ඔස්සේ හැකියාව ලැබෙනු ඇත. එය වඩාත් බරපතළ මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයකි.
මෙම දිවයින ප්‍රවෘත්තිය ගත් විට එහි දැක්වෙන ප්‍රකාශයන් හෝ සංඛ්‍යාලේඛනයන් ලබාගත්තේ කොතැනකින්ද යන වග සඳහන් වී නැත. මෙසේ මෙහි කිසිදු මූලාශ්‍රයක් සඳහන් නොවන්නේ මෙම ප්‍රකාශයන් හා සංඛ්‍යා ලේඛනයන් ලබාගත් රහස්‍ය මූලාශ්‍රයන් ආරක්ෂා කිරීමටද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?